# පඤ්ඤත්ති විනයෙන් හෙළිවන මනෝ විද්‍යාත්මක ලක්ෂණ

**දර්ශනපති පාතේගම ඤාණිස්සර හිමි.**

වර්තමානයේ බෙහෙවින් ජනප්‍රිය වී ඇති මනෝ විද්‍යාත්මක සංකල්ප බෞද්ධ අධ්‍යාපනය තුළ ද දක්නට හැකි බව ඒ පිළිබඳ ව අධ්‍යයනය කරන්නකු හට මැනවින් පැහැදිලි වෙයි. බෞද්ධ අධ්‍යාපනය තුළ ශිෂ්‍යයාගේ යහපත් පැවැත්ම අපේක්ෂාවෙන් විනය ප්‍රඥප්ති පනවා ඇති අතර ඒවා මනෝවිද්‍යාත්මක ස්වරූපය ගෙන ඇති අයුරු පෙනේ.

විනය යනු කුමක් ද? විනය නම් කය වචන දෙකෙහි හික්මීමයි.[1]

බුදුරජාණන් වහන්සේ විසින් ශිෂ්‍යයාගේ කය වචන දෙකෙහි සංවරය අපේක්ෂාවෙන් විනය නීති පනවා තිබේ. විනය යන වචනයෙන් ශිෂ්‍යයාගේ බාහිර සංවරය පිළිබඳ ව සාකච්ඡා කෙරේ. පුද්ගලයකුට බාහිර සංවරය ඇති කර ගත් පසු එම තත්ත්වය අභ්‍යන්තර සංවර්ධනය සඳහා උපකාරී වේ. කවර සමාජයක වුව ද පුද්ගල සංවර්ධනයක් ඇති කිරීමට පුද්ගල ශික්ෂණය වැඩි දියුණු කිරීමට, යහපත් පැවැත්ම චිරස්ථායි කිරීමට පහසු වන්නේ විනය හෙවත් මනා චර්යා ධර්ම පද්ධතියක් මත ය. විනය බෞද්ධ අධ්‍යාපනයේ සංවර්ධනය කෙරෙහි වෙසෙසින් බලපාන්නේ ය. හේතුව විනය පිරිහුණු කල්හි බුද්ධ ශාසනය ම පැවැත්ම ද ඇන හිටින බව අවධාරණය වී ඇත.[2]

---

1. මහාවග්ගපාළිය - ප්‍රථම භාගය - සංඥාපනය (බු.ජ.ත්‍රි.ග්‍ර.මා.)
2. 'විනයො නාම සාසනස්ස ආයු. විනයෙ ඨිතෙ සාසනං ඨිතං හොති.' (සමන්තපාසාදිකාව)

ශිෂ්‍යයාහට විනය නීති පැනවීමට හේතු කාරණා වූයේ කෙබඳු සංසිද්ධීන් දැයි විමසා බැලීම වැදගත් වෙයි. බුද්ධත්වයෙන් විසි වසක් ගත වන තුරු ම ස්ථිර විනය පද්ධතියක් පනවා නැති අතර ඕවාද ප්‍රාතිමෝක්ෂය[3] ඒ කාලය තුළ භික්ෂූන් වහන්සේලාට ප්‍රමාණවත් වී තිබේ. ශිෂ්‍යයා තුළ සිය අභිමතාර්ථ සාධනය කෙරෙහි අවශ්‍යතාව මනාසේ පවතින කල්හි විනය නීති පැනවීමේ අවශ්‍යතාවයක් මතු වී නැත.

එය බුද්ධශාසනයේ ආදී සමයේ ම විනය නීති නො පැනවීමෙන් පැහැදිලි වෙයි. සසුනේ ආරම්භක සමය තුළ දී ධර්මයට ප්‍රධාන ස්ථානය හිමි කර දී තිබේ. එය එසේ වූයේ ඇයි? මුල් සමයේ බුද්ධ ශාසනයට ඇතුළත් ව පැවිදි බවට පත් ශිෂ්‍ය පිරිස සිය පරමාර්ථය වෙත අවධානය නැඹුරු කළා විනා වෙනත් පරමාර්ථය කෙරේ ශිෂ්‍යයා ඇදී ගියේ නැත. බුදු සසුනෙහි ප්‍රව්‍රජ්‍යා භූමියට පත් ඔවුහු මහණදම් පුරමින් සාර්ථක ව පැවිදි ජීවිතයක් ගත කළ අතර අවසානයේ ඔවුහු පූර්ණ පෞරුෂයකින් පරිපූර්ණයන් බවට පත්වූහ.

තම කාර්යය මනාසේ ඉටු කරන තාක් ශිෂ්‍යයාට විනය නීති පනවා වෙහෙසට පත් කිරීම අගෝචර ක්‍රියාවක් වශයෙන් කල්පනා කළ බුදුහු එබඳු දේ කිරීමට උත්සාහ නො ගත්හ. ඔවුනට දිය යුතු අවවාදය දීමට නොපැකිල ව බුදුහු ඉදිරිපත් වූහ.

'මහණෙනි, බොහෝ දෙනාගේ හිතසුව පිණිස

3. දී.නි. 2 මහාපදාන සූත්‍රය,
පිට 31. (බු.ජ.ත්‍රි.ග්‍ර.මා.)
'ඛන්ති පරමං තපො තිතික්ඛා - නිබ්බානං පරමං වදන්ති බුද්ධා නහි
පබ්බජිතො පරූපඝාති - සමණො හොති පරංවිහෙඨයන්ති.
සබ්බපාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියොදපනං - එතං බුද්ධානසාසනං
අනූපවාදො අනූපඝාතො පාතිමොක්ඛෙ ච සංවරො
මත්තඤ්ඤුතා ච භත්තස්මිං පන්ථං ච සයනාසනං
අධිචිත්තෙ ච ආයොගො ඒතං බුද්ධානුසාසනං.'



චාරිකාවේ හැසිරෙන්න.[4] යන ශ්‍රී මුඛ දේශනාවෙන් බුදුරජාණන් වහන්සේගේ අපේක්ෂාව කෙබඳු ද යන්නත් ශිෂ්‍යයාගෙන් උන්වහන්සේ බලාපොරොත්තු වූයේ කෙබඳු දෙයක් ද යන්නත් පැහැදිලි කෙරේ.

භික්ෂු සමාජයේ ඒකායන වූ පරමාර්ථයක් ඇතිව සිය ජීවිතය සකස්කර ගන්නා ශිෂ්‍යයෝ සිටින විට විනය නීති පැනවීමේ අවශ්‍යතාවක් මතු නොවෙයි. යම් සමාජයක් සරල දිවි පැවැත්මෙන් පරිපූර්ණ ව අපේක්ෂිත අරමුණ සාධනය කිරීමෙහි නියැලී සිටින විට ශික්ෂාපද පැනවීමෙහි අවශ්‍යතාවක් මතු වන්නේ නැත. නමුත් පසුකාලීනව ශිෂ්‍යයෝ අපේක්ෂිත අරමුණ දෙදරවා වෙනත් අරමුණු ඉටුකර ගැනීමට උත්සාහ දැරූහ. එවිට ඔවුන්ගේ සංවරය හා ශික්ෂණය සඳහා ශික්ෂාපද සමූහයක් පනවා ඇත. විවිධ විෂමාචාරයන්ගෙන් ශිෂ්‍යයා මුදා ගැනීමට ශික්ෂා පද පැනවීම අවශ්‍ය වූ අතර එබඳු දේ පැනවූයේ ඔහුට දඬුවමක් දීමේ අදහසින් නොවේ. එය ශිෂ්‍යයාගේ මනා සංවරය ඇතිකර ගැනීමටත් සදාචාරය වෙත නැඹුරු කරවීමත් උදෙසා ය. බුදුරජාණන් වහන්සේ විසින් කරුණු දහයක උපයෝගීතාවයක් මත විනය ශික්ෂා පනවා තිබේ.

* සංඝයාගේ යහපත් පැවැත්ම.
* සංඝයාගේ පහසුව.
* නොදැමුණු පුද්ගලයන් දමනය කිරීම.
* ශික්ෂාකාමී භික්ෂූන්ගේ පහසු විහරණය.
* මෙලොව වශයෙන් ඇතිවන ආශ්‍රවයන්ගෙන් ආරක්ෂා වීම.
* පරලොව වශයෙන් ඇති වන ආශ්‍රවයන්ගෙන් ආරක්ෂා වීම.
* නොපැහැදුන අයගේ පැහැදීම.
* පැහැදුන අයගේ වැඩි පැහැදීම.
* සද්ධර්මය බොහෝ කලක් පැවතීම.

4. මහාවග්ගපාලි 1, එකොළොස්වන මාර කථා.
පිට 42 (බු.ජ.ත්‍රි.ග්‍ර.මා.)
'චරථ භික්ඛවේ චාරිකං බහුජන හිතාය බහුජන සුඛාය
ලෝකානුකම්පාය අත්ථාය හිතාය සුඛාය දේව මනුස්සානං'

* භික්ෂු සංවරයට අනුබල දීම.[5]

බුදුරජාණන් වහන්සේ විනය නිති පනවා ඇත්තේ ශිෂ්‍යයන්ගේ පෞද්ගලික සංවරය උදෙසා ය. ගිහි සමාජයේ ද විශේෂයෙන් පැවිදි සමාජයේ ද මුඛ්‍ය අංශය සංවරයයි. යම් පුද්ගලයකු හෝ සමාජයක් සතුව සංවරය නොමැතිනම් නිසියාකාරව කිසිදු කටයුත්තක් කළ නො හැකි ය. සමාජයට බුදුහිමියන් ඉදිරිපත් කළ නිවැරදි ආදර්ශය පැවිදි සමාජයෙන් නිරූපනය වන අතර ගිහි සමාජය ඒ අනුව හැඩ ගැසේ. විනය නීති පැනවීමට හේතු කාරණා වුයේ කෙබඳු කරුණු ද යන වග මුල දී සාකච්ඡා කළෙමු. විශේෂයෙන් එහි ලා අවධානය යොමු කළ යුත්තේ විනය නීති පැනවීම මගින් ශිෂ්‍යයාගේ යහපත අභිවෘද්ධිය පිළිබඳ ව ඇති කර ගත් උතුම් අරමුණු පෙර දැරි කොට ගෙන විනය නිති පනවා තිබේ.

විනය නීති පැනවීම පිළිබඳ ව සලකා බැලීමේ දී වැදගත් වන තවත් කරුණක් වන්නේ බුදුහිමියන්ගේ හිතුමනාපයට නොව ශිෂ්‍යයන්ගේ ඉල්ලීම මත විනය නීති පනවා තිබෙන බව ය. තම සමාජයේ යහපත් පැවැත්ම උදෙසා විනය නීති පනවන ලෙස ශිෂ්‍යයන් විසින් ඉල්ලනු ලැබ තිබේ. සාරිපුත්ත මහ රෙුන් විසින් විනය නීති පනවන ලෙස බුදුහිමියන්ගෙන් ඉල්ලූ අවස්ථාවේ දී උන්වහන්සේ විසින් කරනු ලැබ ඇති ප්‍රකාශය මගින් විනය ශික්ෂාපද පිළිබඳ ව උන්වහන්සේගේ ආකල්පය කෙබඳුදැයි පැහැදිලි වෙයි.

5. පාරාජිකාපාලි පිට 2. (බු.ජ.ත්‍රි.ග්‍ර.මා.)
* සංඝ සුට්ඨුතාය
* සංඝ ඵාසුතාය
* දුම්මංකූනං පුග්ගලානං නිග්ගහාය
* පේසලානං භික්ඛුනං ඵාසු විහාරාය
* දිට්ඨ ධම්මිකානං ආසවානං සංවරාය
* සම්පරායිකානං ආසවානං පටිඝාතාය
* අප්පසන්නානං පසාදාය
* පසන්නානං භියෙ‍යාභාවාය
* සද්ධම්මට්ඨිතිකා
* විනයානුග්ගහාය.



සාරිපුත්තය, මේ සාසනයෙහි යම්තාක් කල් ආශ්‍රවයන් ඉපිද සිටීමට උපකාරී වන ඇතැම් ධර්මයන් සංඝයා කෙරෙහි නොවෙත් ද, ඒ තාක් කල් ශාස්තෘන් වහන්සේ ශ්‍රාවකයන් හට ශික්ෂා පද නො පනවති. යම් කලෙක මේ සාසනයේ ආසවට්ඨානීය ධර්ම නැසීම පිණිස ශික්ෂාපද පනවති.[6]

මෙමගින් පැහැදිලි වන ප්‍රධාන කරුණක් වෙයි. බුදුරජාණන් වහන්සේ ශ්‍රාවක නිදහස පිළිබඳ ව කෙතරම් දුරට අගය කොට තිබේ ද යන කරුණු එහි දී පැහැදිලි වෙයි. ශ්‍රාවකයාගේ ඉල්ලීමේ දී පවා විනය ශික්ෂා පද පැනවීම කෙරෙහි දැඩි අවධානයක් බුදු හිමියන් විසින් දක්වා නොමැත. උන්වහන්සේ ශිෂ්‍ය කේන්ද්‍රීය බවට ලබා දුන්නේ සුවිශේෂ ස්ථානයකි. විනය නීති පනවන්නට වීම ද සසුනේ එක්තරා පරිහානියක් ලෙස දුටු උන්වහන්සේ විනය නිති නො පනවා සසුන ගෙනයාම කෙරෙහි සුවිශේෂ උනන්දුවක් දක්වා තිබේ. අධ්‍යාපන විද්‍යාවේදී මෙම අදහස සුවිශේෂ ගණයෙහි ලා සාකච්ඡා කළ හැකි ය. දඬුවම හා නීති පැනවීම අවශ්‍ය වන්නේ එක්තරා සීමා සහිත රාමුවක් තුළ විනා සමස්ත ප්‍රජාව කෙරෙහි ම නො වන බව බෞද්ධ අධ්‍යාපන අදහස්වලින් ගම්‍යමාන වෙයි. ශිෂ්‍යයාහට නිදහසේ සිතා මතා ඒ අනුව කටයුතු කිරීමට මඟ පෙන්වීම අධ්‍යාපනයේ ප්‍රධාන කාර්ය භාරය වන අතර එමගින් වඩාත් නිවැරදි ලෙස මනසෙහි ප්‍රතිජනනාත්මක අදහස් වර්ධනය වීම සිදු වෙයි. ශිෂ්‍යයාගේ ආධ්‍යාත්මික ශික්ෂණය කෙරෙහි නොමඳ අවධානයක් බෞද්ධ අධ්‍යාපනය තුළ

6. පාරජිකාපාලි පිටුව 22 - 35 (බු.ජ.ත්‍රි.ග්‍රා.ම)
න තාව සාරිපුත්ත සත්ථා සාවකානං සික්ඛා පදං පඤ්ඤපෙස්සති. න උද්ධිසති පාතිමොක්ඛං යාව න ඉධෙකච්චෙ ආසවට්ඨානියා නං ධම්මා සංඝෙ පාතු භවන්ති අථ සත්ථා සාවකානං සික්ඛා පදං පඤ්ඤාපෙති උද්දිසති. පාතිමොක්ඛං තෙ සඤ්ඤෙව ආසවට්ඨානියානං ධම්මානං පටිඝාතාය.

දක්නට ඇත. දඬුවම හා විනය නීති පැනවීම මගින් ශිෂ්‍යයා එක්තරා සීමාබන්ධන සන්තතියකට යටත් කරනු ලබන අතර ඒ පිළිබඳ ව බුදුසමයෙහි අදහස මන්දගාමී වූවක් වෙයි. 'විනය නීති පැනවූ සෑම අවස්ථාවකම එම විනය නීති පැනවීමට හේතු වූ අපරාධය විභාග කොට තිබීමෙන් බුදුරජාණන් වහන්සේ ඒ පිළිබඳ ව දැක්වූ ආකල්පය කෙබඳු ද යන්න පැහැදිලි වේ.[7] විනය නීති ලෙස ශිෂ්‍යයාට පැන වූ නීති ආරම්භක සමයේ දක්නට නො ලැබුණි. භික්ෂූන් වහන්සේලා උදෙසා දේශනා කරන ලද සූත්‍ර ධර්මවලට විනය නීති ඇතුළත් ව පවතින බව සූත්‍ර පිටකයේ සූත්‍ර ධර්මවලින්[8] පැහැදිලි වෙයි. ශික්ෂා පද විරහිත ව සංඝ සමාජය එසේ පැවතියේ සරල ස්වාභාවයේ ප්‍රතිඵලයක් වශයෙනි.[9]

'යම් භික්ෂුවක් වනාහී ප්‍රාතිමොක්ෂ සංවරයෙන් සංවර ව ආචාර ගෝචර සම්පන්න ව කුඩා වුවත් වරදෙහි බිය දක්නා සුළු ව ශික්ෂාපද සමාදන්ව'

යනාදී විනයට සම්බන්ධ ප්‍රකාශ, දී.නි. සාමඤ්ඤඵල, ම.නි. අප්‍රමාන, ගණක මොග්ගල්ලාන, දන්තභූමි වැනි සූත්‍රවල දක්නට ලැබේ.

යම් සමාජයක යහපත් පැවැත්මක් අපේක්ෂා කළ හැක්කේ එම සමාජයේ ජීවත්වන පුද්ගලයන්ගේ ශික්ෂණය මතය, පුද්ගලයා සතුව ශික්ෂණය පවතින තාක් එම සමාජය තුළ අරබුද හටගන්නේ නැත. භික්ෂු සමාජය තුළ මුල් සමයේ විනය නීති පැනවීමේ අවශ්‍යතාවක් නො වූයේ ස්වයං ශික්ෂණය ඔවුන් සතුව පැවති හෙයිනි. විනය නීති මාලාවක් යටතේ සංඝ සමාජය සංවිධානය කිරීමේ අපේක්ෂාවක් බුදුරජාණන් වහන්සේ අපේක්ෂා

---

7. අබේසුන්දර, ප්‍රණීත්. **අපරාධය පිළිබඳ බෞද්ධ ආකල්පය** සම්භාෂා - පළමු වෙලුම, තෙවන කලාපය. පිට 134.
8. සු.නි. ධම්මික සූත්‍රය. පිට 112. (බු.ජ.ති.ග්‍ර.මා.)
9. මේධානන්ද හිමි, දේවාලේගම - **බෞද්ධ භික්ෂු සමාජය මූලික කරුණු කිපයක්**
ආරිය ප්‍රකාශකයෝ, වරකාපොළ. පිට 14.



නො කළහ.[10] එනමුදු සසුනේ කාලයක් ගතවීම හේතුවෙන් යම් යම් විනය නීති පැනවීමේ අවශ්‍යතාව මතු වී තිබෙන අතර එබඳු සාධක සතරක් දක්වා තිබේ.

1 ශාසනය ආරම්භ වී දිගු කලක් ගතවීම.
2 ශාසනය පිරිස අතින් විශාල වීම.
3 ශාසනයට බොහෝ ලාබ සත්කාර වැඩිවීම.
4 . ශාසනයේ උගතුන් වැඩිවීම.[11]

ශාසනය ආරම්භක සමයේ විනය නීති පැනවීමක් නො තිබුණ ද එම තත්ත්වය පසුව ක්‍රමයෙන් වෙනස් වී තිබේ. ශාසනයට ඇතුළත් වන පිරිස ක්‍රමයෙන් වැඩි වූ අතර ලැබෙන ලාභ සත්කාර බහුල වන්නට විය. සමකාලීන ඉහළ පෙළේ ධනවතුන් වූ රජවරු, සිටුවරු විශාල වශයෙන් සසුනට උදව් උපකාර කරන්නට වූහ. භික්ෂු ජීවිතයේ අරමුණ පවා අවබෝධ කර නොගත් ඇතැම් විෂමාචාර භික්ෂූන් වහන්සේලා නිසා විනය නීති පැනවීමේ අවශ්‍යතාවය මතු වුව ද මුල් කාලයේ ඕවාද ප්‍රාතිමොක්ෂය[12] නිසා සියලු දෙනාගේ සංවරය ඇති වී තිබේ.

---

10. එම - පිට 17
11. පාරාජිකපාලි - පිට 22 - 35. (බු.ජ.ත්‍රි.ග්‍ර.මා)
'සංඝො රත්තඤ්ඤු මහත්තං පත්තො හොති
සංඝො වේපුල්ල මහත්තං පත්තො හෞති
සංඝො ලාභග්ග මහත්තං පත්තො හොති
සංඝො බාහුසච්ච මහත්තං පත්තො හෙති.'
12. දී.නි. 2 - මහාපදාන සූත්‍රය. පිට 31.
'ඛන්ති පරමං තෙපො තිතික්ඛා
නිබ්බානං පරමං වදන්ති බුද්ධා
නහි පබ්බජිතො පරූපඝාති
සමණො හොති පරං විහෙඨයන්ති
සබ්බ පාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියොදපනං - එතං බුද්ධානුසාසනං,
අනූපවාදො අනූපඝාතො - පාතිමොක්ඛෙ ච සංවරෙ
මත්තඤ්ඤුතා ච භත්තස්මිං - පන්ථං ච සයනාසනං
අධි චිත්තො ච ආයෝගො - ඒතං බුද්ධානු සාසනං'

සියලු භික්ෂූන් වහන්සේලා මේ ඔවදනින් හික්මී ඉතා සැහැල්ලුවෙන් එකිනෙකා කෙරෙහි ප්‍රිය උපදවන නෙතින් බලමින් සිතින් කයින් හා වදනින් ඔවුනොවුන්ට මෛත්‍රී කරමින් සමගි ව විසූහ.[13]

සසුන ආරම්භක සමයෙහි විනය නීති භික්ෂූන් උදෙසා පැනවීමේ අවශ්‍යතාවක් නොවුණු ආකාරය සූත්‍ර ධර්ම පැහැදිලි කරයි.

'මහණෙනි, ඒකාන්තයෙන් ම භික්ෂූන් වහන්සේලා මුල් කාලයේ දී මගේ සිත සතුටු කළහ. මහණෙනි ඒ මුල් අවස්ථාවේ සිටි භික්ෂූන්ට මවිසින් අනුශාසනා කළ යුතු නොවීය. සිහිය ඉපදවීම පමණක් එකල ප්‍රමාණවත් විය'[14]

මේ අනුව බුද්ධ ශාසනයේ ශිෂ්‍යයා දිවි දෙවෙනි කොට සික පද ආරක්ෂා කළ අයුරු පැහැදිලි ය. ශිෂ්‍යා කෙරෙහි ශිෂ්‍ය කේන්ද්‍රීය දෘෂ්ටිකෝණයකින් බැලීම බුදු සමයෙහි සිරිත විය. දඬුවම මගින් ශිෂ්‍යයා හික්ම වීමට තැත් කළ අවස්ථා බුදු සමය තුළ බෙහෙවින් විරළ ය. හැකිතාක් දුර විනය නීති නො පනවා ස්වයං ශික්ෂණය පුද්ගල අභ්‍යන්තරයට කිඳා බැස්සවීමට බුදුහු උත්සාහ දැරූහ.

ශික්ෂා පද සමූහයක් පනවා ඒ ශික්ෂා පද ගොන්නෙහි ලා ශිෂ්‍යයා සංවර කර ලීමෙහි අපේක්ෂාවක් බුදු හිමියන් හට නොවී ය. ශික්ෂා පද පැනවිය යුත්තේ ශිෂ්‍යයාහට ය. ශික්ෂාපද වැඩි වීම යනු සසුනේ දියුණු අවස්ථාවක් නොවේ. භද්දාලි හිමියන් හට බුදුන් වහන්සේ දෙන ලද අවවාදවලින් මේ කරුණු මැනවින් පසක් වෙයි.

---

13. ම.නි. **භද්දාලි සූත්‍රය**. පිට 174. (බු.ජ.ත්‍රි.ග්‍ර.මා.)
14. ම.නි. **අංගුලිමාල සූත්‍රය**. පිට 524. (බු.ජ.ත්‍රි.ග්‍ර.මා.)



භික්ෂූහු විනය ප්‍රඥප්ති අනුගමනය කළ අතර ඒවායේ තමන්ට ඇතිවන ප්‍රශ්න බුදුරජාණන් වහන්සේගෙන් විචාළහ. විනය නීති සම්බන්ධයෙන් මතු වූ ප්‍රශ්නවලට සාධාරණ විසඳුම් ඉදිරිපත් විය. විනය නීති සම්බන්ධයෙන් ගැටළු මතුකරන ශිෂ්‍යයෝ බුදු හිමියන් විසින් දෙන ලද පිළිතුරුවලින් සෑහීමකට පත් වූහ. එපමණක් නොව එම පිළිතුරෙන් ඔවුහු සතුටට මෙන් ම ප්‍රමෝදයට පත්වූහ.

දිනක් බුදුරජාණන් වහන්සේ වෙත පැමිණි භද්දාලි නම් භික්ෂුව ප්‍රශ්න කීපයක් විචාර තිබේ. 'ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස කලින් ශික්ෂා පද අඩු වීමටත්, රහත් අය වැඩි වීමටත් දැන් ශික්ෂාපද වැඩි වීමටත්, රහත් අය අඩු වීමටත් හේතුව කුමක්ද? යන ප්‍රශ්නය ඉන් පළමු වැන්න ලෙස දැක්විය හැකිය. මෙයට පිළිතුරු ලබා දෙන බුදු හිමියන් ප්‍රකාශ කොට ඇත්තේ ප්‍රතිපත්ති පූරන අය අඩුවන විට, ප්‍රතිපත්ති අතුරුදහන් වන විට ශික්ෂාපද වැඩිවන බවත් රහත් බව ලබන අය අඩුවන බවත් ය.

භද්දාලි හිමියන් විසින් මෙබඳු ප්‍රශ්නයක් ද බුදු හිමියන්ගෙන් විමසා තිබේ. 'ඇතැම් භික්ෂූන් අතින් වැරදි සිදු වූ විට මෘදු ආකල්පයකිනුත් ඇතැම් භික්ෂූන්හට දෘඩ ආකල්පයකිනුත් කටයුතු කරන්නේ මන්ද යනු එම ප්‍රශ්නයයි. ඒ සඳහා යම් වැරැද්දක් කළ පසු එයට ලක්වූ පුද්ගලයාගේ ස්වභාවය විමසා බලා ඒ අනුව කටයුතු කරන බව බුදුහිමියන් විසින් පැහැදිලි කරනු ලැබ තිබේ.

මෙම සාකච්ඡාව තුළින් අධ්‍යාපන විද්‍යාව සඳහා උකහා ගත හැකි වැදගත් කරුණු කීපයක් වෙයි. එනම් දඬුවම් දීම මගින් සම්පූර්ණ වශයෙන් ශිෂ්‍යයකු සකස් කළ හැකිද? යන කරුණයි. අනෙක දඬුවම දිය යුත්තේ වරදෙහි ප්‍රමාණය සලකා නොව එය කරන පුද්ගලයාගේ ස්වභාවය පිළිබඳව අධ්‍යයනයකින් පසුව ට බව ය.

මෙහිලා අප සාකච්ඡා කරනු ලැබූ ප්‍රථම කරුණ වූයේ දඬුවම් දීම මගින් ශිෂ්‍යයකු පූර්ණ වශයෙන් සකස් කළ හැකිද යන කරුණයි. ශිෂ්‍යයකු සකස් කිරීම පිණිස දඬුවම් කරන්නේ නම්, දඬුවම් කිරීම සඳහා අවස්ථාව මතු වන්නේ කෙබඳු

අවස්ථාවන් හිදීදැයි සොයා බැලිය යුතු ය. යම් අධ්‍යාපන ශික්ෂණයක් කරා ශිෂ්‍යයා යොමු කරවීමේදී එකී කටයුතු වලට කෙළින්ම සම්බන්ධ නොවීම ශිෂ්‍යයා අතින් සිදුවන වරදක් වෙයි. එබඳු අවස්ථාවල ඔහුට දඬුවම් පැමිණවීමෙන් යථා තත්ත්වයට නැවත ළඟා කරගත හැකි වන්නේද? නොඑසේනම් ඔහු වෙත ලබා දිය යුතු වන්නේ අවබෝධය ද යන්න විමසා බැලීම අත්‍යවශ්‍ය වූවක් බවට බෞද්ධ අධ්‍යාපන තුළින් පුද්ගලයා තවදුරටත් මෙහෙයවනු ලබයි. නූතන අධ්‍යාපන විද්‍යාඥයන් විසින්ද දඬුවමට සුවිශේෂ ස්ථානයක් ලබා දී නොමැති බව අවධාරණය කළ හැකිය.

වරදකට දඬුවම් දීමේදී විශේෂයෙන් ම එම පුද්ගලයාගේ ස්වභාවය සලකා බලා එය කළ යුතු ආකාරය බෞද්ධ අධ්‍යාපනය මගින් මැනවින් නිරූපනය කොට ඇත. පුද්ගල මනස පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කළ අධ්‍යාපන ක්‍රමයක් වශයෙන් බෞද්ධ අධ්‍යාපනයට මෙහිලා සුවිශේෂ ස්ථානය අමතක කළ යුතු නොවේ. පුද්ගලයාගේ මානසික මට්ටම හා දැනුම් මට්ටම ඔහුගේ අධ්‍යාපන කාර්යය විෂයෙහි බෙහෙවින් බලපානු ලබන අතර යම් වරදකට පුද්ගල ස්වභාවය විමසා බැලීමකින් තොරව දඬුවම් කිරීමට යාමේදී බලාපොරොත්තු විරහිත ප්‍රශ්න මතුවිය හැකි ය. එබඳු තත්ත්වයන්ට මුහුණ පෑමට සිදු වන්නේ පුද්ගලයා පිළිබඳ ව අවබෝධයකින් තොරව දඬුවම් දුන් විට වන අතර පුද්ගල ස්වභාවයට මෙහිලා වැදගත් ස්ථානයක් හිමිකර ඇති බව පෙනේ.

පුද්ගල කායික චර්යාවන් තීරණය වන්නේ ඔහුගේ මානසික මේරීමේ ප්‍රමාණය අනුව ය. ඒ අනුව යම් දඬුවමක් දීමේදී පුද්ගල ස්වභාවය සොයා බැලීම වැදගත් වෙයි. එම තත්ත්වයට නූතන මනෝවිද්‍යාඥයන් පවා අවධාරණය කරන අතර මෙම මනෝ විද්‍යාත්මක සංකල්ප මුල් බුදුසමය තුළ බෙහෙවින් අවධාරණය වී ඇති බවට හද්දාලි සූත්‍රය පැහැදිලි නිදසුනක් වෙයි. විනය ප්‍රඥප්ති පවා ශිෂ්‍යයා සමග සුහද සාකච්ඡාවට බඳුන් වූ මෙබඳු අවස්ථා මුල් බුදු සමය තුළ බෙහෙවින් දක්නට හැකි ය. ශික්ෂා පද පැනවීම මගින් හා දඬුවම් දීම නිසා පුද්ගලයා විනාශ කර දැමීමේ ආකල්පයන් බුදු සමය තුළ නැති අතර පුද්ගලයාගේ ආයති සංවරය මැනවින් පෝෂණය කිරීමේ උදාර අදහස බුදුසමය තුළ පැවති බව පෙනේ.